

# කුහුඹුවෝ සහ සීනි කැටය

I.N යෙහෙන්සා ඉලංගරත්න

# කුහුඹුවෝ සහ
# සීනි කැටය

ISBN NO
978-624-211-243-5

I.N යෙහෙන්සා ඉලංගරත්න

මහ/මහමායා බාලිකා විද්‍යාලය
2 ශ්‍රේණිය c

2026 - 2 – 28

I.

# පිදුම

මට අකුරු උගන් වන ගුරු මෑණියන්ට මෙම පොත පුදමි.



## පෙරවදන


දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

2026-10-06



ඔන්න එකෝමත් එක කාලෙක හිටියා රතු කූහුඹුවෙකුයි
කළු කුහුඹුවෙකුයි.


.

මේ දෙන්නා එක දවසක්  කෑම හොයන්න ගියා.

.

මේ දෙන්නා දැක්කා ඒ දණ්ඩෙන් එහා සීනි කැටයක් තියනවා.







ඒ සීනි කැටය ගන්න ඒ දණ්ඩෙන් එහාට යන්න ඕනෑ.
ඒ දෙන්නාම සීනි කැටය ගන්න ගියා.



ළග හිටි කුරුල්ලෙක් මෙහෙම කීවා
''යන්න එපා ගඟට වැටෙයි''
මේක අහන්නේ නැතිව දෙදෙනා
ඒ දණ්ඩෙන් යන්න ගියා



අනේ කළු කුඹියා ගඟට
වැටුණා.
රතු කඹියා කෑගහනවා
කවුරුත් නැද්ද මගේ යාලුවා
වැටුනා බේරගන්න.




මේ කෑ ගහන සද්දය තාරාවෙකුට
ඇහුණා.
තාරාවා ඉක්මනින් එතනට ආවා.



තාරාවා කලු කූඹියා පිටේ
තියාගෙන ගඟෙන් එගොඩට
ආවා.




රතු කූඹියා හා කලු කූඹියා
තාරාවට ස්තූති කළා.



කුරුළු පැටියා එතනට ආවා. කුරුළු යාලුවා කියපු දේ අපිට අහන්න තිබුණෝ කියලා කූඹී යාලුවෝ කීවා.

අනෙක් අය කියන දේවල් අහන්න අපි පුරුදු වෙන්න ඕනේ. කූඹී යාලුවෝ කීවා.



කුරුල්ලා ඒ දණ්ඩෙණ් එහා තිබුණ
සීනි කැටය කුඹියන්ට ගෙනල්ලා
දුන්නා

බොහොම ස්තූතී යාලුවේ කූඹී
යාලුවෝ කුරුල්ලාට ස්තූති කරා.

ඊට පස්සේ අනතුරු තැන් වලට කෑම
හොයන්න ගියේ නෑ.

# ස්තූතිය.

කතන්දර පොත ලිවීමට උපදෙස් දුන් ගුරු මෑණියන්ට බොහොම ස්තූතියිග කතන්දරය සදහා උදව් කල මගේ අම්මාට, තාත්තාට, අයියාට, අක්කිටත් බොහොම ස්තූතියි. කතන්දරය **type** කර සකසා දුන් වරුණ ජයවීර අයියාටත් බොහොම ස්තූතියි.

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරීවූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකිනිසාය තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් හේමමාලා උපහාර ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය දියත්වෙයි පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාර ධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි

මහනුවර මහාමායාබාලිකා විද්‍යාලයේ දියණියන් විදුහල්පතිනිය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද දියවඩන තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් උපහාර දක්වමු

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)